# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1946/31 - 2015 දෙසැම්බර් මස 22 වැනි අඟහරුවාදා - 2015.12.22

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 9/2014.

**1968 අංක 32 දරන පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ පනත**

1968 අංක 32 දරන පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ පනතේ 52 වන වගන්තිය යටතේ අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග.

එස්. බී. නාවින්න,
අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන
හා සංස්කෘතික කටයුතු අමාත්‍ය.

2015 දෙසැම්බර් මස 22 වැනි දින.
බත්තරමුල්ල දී ය.

නියෝග

1. මෙම නියෝග 2015 පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ (සංශෝධන) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ :-

2. 2005 මාර්තු මස 29 වන දින අංක 1386/17 දරන *ගැසට් පත්‍රයේ* පළ කරන ලද 2005 පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ නියෝග මගින් සංශෝධිත, 1971 දෙසැම්බර් මස 30 වන දින අංක 14991 දරන *ගැසට් පත්‍රයේ* පළ කරන ලද 1968 අංක 32 දරන පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ පනතේ 52 වන වගන්තිය යටතේ සාදන ලද 1971 පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ නියෝග පහත දක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(1) එම නියෝගවල 7 වන නියෝගයේ ''ඉ ආකෘති පත්‍රය'' යන යෙදුම ඉවත් කොට ඒ වෙනුවට ''ආ ආකෘති පත්‍රය'' යන යෙදුම ආදේශ කිරීමෙන් ;

(2) එම නියෝගවල 8 වන නියෝගයේ ''ඊ ආකෘති පත්‍රය'' යන යෙදුම ඉවත් කොට ඒ වෙනුවට ''ආ ආකෘති පත්‍රය'' යන යෙදුම ආදේශ කිරීමෙන් ;

(3) එම නියෝගවල 11 වන නියෝගය ඉවත් කර ඒ වෙනුවට පහත දක්වෙන නියෝගය ආදේශ කිරීමෙන්.

''11. මේ පනතේ 9 (3) වන වගන්තියේ කාර්යයන් සඳහා අවශ්‍ය ඡායාරූප, එම කාර්යය සඳහා කොමසාරිස් ජනරාල්වරයා විසින් ලියාපදිංචි කරන ලද ලියාපදිංචි ඡායාරූප ශිල්පියකු විසින් හෝ ඡායාරූප ගැනීමේ කාර්යය සඳහා කොමසාරිස් ජනරාල්වරයා විසින් බලය පවරන ලද නිලධරයකු විසින් ගත යුතු ය.''.

1A - PG 2738 — 806 (2015/12)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(4) එම නියෝගවල 12 වන නියෝගය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන නියෝගය ආදේශ කිරීමෙන් :-

"12. 9 වන, 16 වන සහ 17 වන වගන්තිවල කාර්ය සඳහා ඉදිරිපත් කරනු ලැබූ එවැනි යම් ඡායාරූපයක් පහත සඳහන් දිග, පළල, විස්තරවලින්, ප්‍රමිතියෙන් සහ තත්වයෙන් තිබිය යුතු ය.

(i) ඡායාරූප ප්‍රමාණය මි. මී. 35 පළල x මි. මී. 45 උස විය යුතු අතර ඡායාරූපයේ ප්‍රමිතිය පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් ජනරාල්වරයා විසින් සපයනු ලබන මෘදුකාංගය හෝ උපදෙස් අනුව විය යුතු ය.

(ii) මුහුණ ඇස් විවෘතව හා පැහැදිලිව පෙනෙන පරිදි ද, මුඛය වසා සිනහවීමෙන් තොරව ද, කිසිදු හැඟීමක් පළ නොකරන මධ්‍යස්ථ ඉරියව්වෙන් යුක්තව ද විය යුතු ය.

(iii) හිසකෙස් මුහුණට නොවැටෙන පරිදි තිබිය යුතු අතර මුහුණේ කෙලවර තෙක් පැහැදිලිව දිස්විය යුතු ය.

(iv) (අදාළ වේ නම්) ඇස් කණ්නාඩි වීදුරු වලින් කිසිදු ප්‍රතිබිම්භයක් දිස් නොවිය යුතු ය. කාච තුළින් ඇස් පැහැදිලිව දර්ශනය විය යුතු අතර පැහැදිලි කාච (අඳුරු නොකරන ලද) පමණක් පැළඳිය යුතු ය.

(v) ආලෝකය ඒකාකාරී විය යුතු අතර සෙවනැලි, දිලිසීම, හෝ ක්ෂණිකාලෝක පරාවර්තන දර්ශනය නොවිය යුතු ය.

(vi) නිරාවරණය හා ඡායාරූපයේ සුදු පැහැයේ තුලනය අයදුම්කරුගේ සමේ ස්වභාවික වර්ණ සංයෝගය පිළිබිඹු කළ යුතු ය.

(vii) ඡායාරූපයට පෙනී සිටින ආකාරය, කැමරාවට කෙළින්ම මුහුණලා, මුහුණ හා උරහිස් ඡායාරූපයේ මැද පිහිටන පරිදි විය යුතු ය.

(viii) පසුතලය ඒකාකාරීව, පැහැදිලිව ආකෘතික ස්වරූපයෙන් තොරව, ලා නිල් වර්ණයෙන් තිබිය යුතු ය.

(ix) පිළිඹිබුව පැහැදිලි තියුණු සහ නාභිගත විය යුතු ය.

(x) වෘත්තීමය මුද්‍රණ රසායනාගාරයක් භාවිත කරමින් ඡායාරූප වර්ණයෙන් මුද්‍රණය කර තිබිය යුතු ය.

(xi) ඡායාරූපය කිසිදු ආකාරයකින් වෙනස් කර නොතිබිය යුතු අතර එම ඡායාරූපය අයදුම්කරුගේ ස්වභාවික තත්ත්වය පිළිබිඹු කරන ඡායාරූපයක් විය යුතු ය.".

(5) එම නියෝගයේ 13 වන නියෝගය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන නියෝගය ආදේශ කිරීම මගින් :-

13. "(1) මේ පනතේ 52 (2)(ඉ)(ii) වගන්තියේ කාර්යය සඳහා, වෘත්තීය ඡායාරූප ශිල්පියකු වන යම් තැනැත්තකු විසින්, පනත යටතේ ජාතික හැඳුනුම්පත් ලියාපදිංචි කිරීම සහ නිකුත් කිරීම සඳහා ඡායාරූප ගැනීමේ කාර්ය සඳහා ඡායාරූප ශිල්පියකු වශයෙන් ලියාපදිංචි වීම සඳහා කොමසාරිස් ජනරාල්වරයා වෙත ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

(2) ඉල්ලුම්කරු විසින් -

(අ) 12 වන නියෝගයේ නිශ්චිතව දක්වා ඇති ප්‍රමිතිවලට එකඟව ඡායාරූප ගැනීම පිළිබඳ ස්වකීය ශක්‍යතාව පිළිබඳ ; සහ

(ආ) ඡායාරූප ගැනීම සඳහා අවශ්‍ය නියමිත උපකරණ ඉල්ලුම්කරු සන්තකයේ පවතින බව ;

සනාථ කරනු ලැබිය යුතු ය.

(3) මේ නියෝග ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව වූ දිනයේ දී ලියාපදිංචි ඡායාරූපශිල්පියකු වශයෙන් ලියාපදිංචි වී ඇති සෑම තැනැත්තකු ම විසින්, මේ නියෝග ක්‍රියාත්මක වන දින සිට එක් අවුරුදු කාලසීමාවක් ඇතුළත කොමසාරිස් ජනරාල්වරයා වෙත නැවත ලියාපදිංචි විය යුතු ය.".

(6) එම නියෝගයේ 14 වන නියෝගය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන නියෝගය ආදේශ කිරීමෙන් :-

"14. ලියාපදිංචිය සඳහා ඉල්ලුම් කරනු ලබන යම් ඡායාරූප ශිල්පියකු කොමසාරිස් ජනරාල්වරයා විසින් ලියාපදිංචි කිරීම හෝ තත්කාර්ය සඳහා හේතු දක්වමින් ලියාපදිංචි කිරීම ප්‍රතික්ෂේප කිරීම කරනු ලැබිය හැකි ය.".

(7) එම නියෝගවල 15 වන නියෝගය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන නියෝගය ආදේශ කිරීමෙන් :-

"15. (1) කොමසාරිස් ජනරාල්වරයා විසින් එම සහතිකයේ නිශ්චිතව දක්වා ඇති කොන්දේසිවලට යටත්ව, 14 වන නියෝගය යටතේ ලියාපදිංචි සහතිකයක් නිකුත් කරනු ලැබිය යුතු ය.

(2) ලියාපදිංචි සහතිකය නිකුත් කර ඇත්තේ යම් නියම හෝ කොන්දේසිවලට යටත්ව ද, එම නියම හෝ කොන්දේසි උල්ලංඝනය වීමක් හෝ සම්පූර්ණ නොවීමක් සිදුව ඇති අවස්ථාවක දී, කොමසාරිස් ජනරාල්වරයා විසින් ලියාපදිංචි සහතිකය අවලංගු කරනු ලැබිය හැකි ය :

එසේ වුව ද, එම අවලංගු කිරීමට පෙරාතුව එම සහතිකය නිකුත් කර ඇත්තේ යම් තැනැත්තකු වෙත ද, එම තැනැත්තාට සවන් දීම සඳහා අවස්ථාවක් ලබා දිය යුතු ය.

(3) යම් ලියාපදිංචි සහතිකයක් නිකුත් කළ දින සිට එක් අවුරුදු කාලයක් සඳහා වලංගු වන්නේ ය.

(4) ඡායාරූප ශිල්පියකු වෙත නිකුත් කරනු ලබන සෑම ලියාපදිංචි සහතිකයක් ම වාර්ෂිකව අලුත් කරනු ලැබිය යුතු ය.".

(8) එම නියෝගවල 16 වන නියෝගය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන නියෝග ආදේශ කිරීමෙන් :-

''16 (1) පනත යටතේ ඡායාරූපශිල්පියකු වශයෙන් යම් තැනැත්තකු ලියාපදිංචි කිරීම සඳහා ලියාපදිංචි ගාස්තුව රුපියල් දස දහසක් වන්නේ ය.

(2) ලියාපදිංචි සහතිකයක් අලුත් කිරීම සඳහා වූ ලියාපදිංචි ගාස්තුව රුපියල් දෙදහසක් වන්නේ ය.''.

(9) එම නියෝගයේ 17 වන නියෝගය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන නියෝගය ආදේශ කිරීමෙන් :-

''17. පනත යටතේ ඡායාරූප ශිල්පියකු වශයෙන් කොමසාරිස් ජනරාල්වරයා විසින් ලියාපදිංචි කරනු ලබන සෑම තැනැත්තකු වෙතම මෙහි උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ''උ'' ආකෘතියට සාරානුකූලව ලියාපදිංචි සහතිකයක් නිකුත් කරනු ලැබිය යුතු ය.''.

(10) මේ නියෝගවල උපලේඛනයේ ''ආ'' ආකෘතිය සහ ''ඇ'' ආකෘතිය මෙයින් ඉවත් කර ඒ වෙනුවට මෙහි උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති අලුත් ''ආ'' ආකෘතිය සහ ''ඇ'' ආකෘතිය ආදේශ කරනු ලැබේ.

(11) මේ නියෝගවල උපලේඛනයේ ''ඉ'' ආකෘතිය සහ ''ඊ'' ආකෘතිය මෙයින් ඉවත් කරනු ලැබේ.

(12) මේ නියෝගවල එහි උපලේඛනයේ ''උ'' ආකෘතිය ඉවත් කර එහි උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති අලුත් ''උ'' ආකෘතිය ඒ වෙනුවට ආදේශ කිරීමෙන්.

පු.ලි.දෙ.වි. 1,7,8

ඉල්ලුම්පත නොමිලයේ නිකුත් කෙරේ. අනුපිළිවෙල අංකය. [ ]

QR Code

පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව

''ආ'' ආකෘතිය

1968 අංක 32 දරන පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ පනතේ 9,16 සහ 17 වන වගන්ති යටතේ හැඳුනුම්පත්‍රයක් සඳහා ඉල්ලුම් පත්‍රය

| දිස්ත්‍රික්කය | ප්‍රා.ලේ. කොට්ඨාසය | ග්‍රා.නි. අංකය හා කොට්ඨාසය |
|---|---|---|
| | | |

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා

හැඳුනුම්පත් අංකය :

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | |

ලියාපදිංචි කිරීමේ නිලධරයාගේ කේතය හා කෙටි අත්සන

| | |
|---|---|
| | |

මෙම ඉල්ලුම්පත උපදෙස් පත්‍රිකාවෙහි ඇති උපදෙස් අනුව සම්පූර්ණ කළ යුතු ය.

පළමුවන කොටස - ඉල්ලුම්කරු විසින් සම්පූර්ණ කළ යුතු ය.

සම්පූර්ණ නම (සිංහලෙන් හෝ දෙමළෙන්)

01.

| | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| පෙළපත් නාමය | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | |
| නම | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | |
| වාසගම | | | | | | | | | | | | | | | |

සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්)

02.

| | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| පෙළපත් නාමය | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | |
| නම | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | |
| වාසගම | | | | | | | | | | | | | | | |

හැඳුනුම්පතෙහි සඳහන් විය යුතු නම (නම 01 කොටුවේ හි නමට වඩා වෙනස් වන්නේ නම්)

03. පෙළපත් නාමය

නම

වාසගම

04. ස්ත්‍රී/පුරුෂ භාවය : ස්ත්‍රී පුරුෂ

05. සිවිල් තත්වය : විවාහක අවිවාහක වැන්දඹු දික්කසාද

06. වෘත්තිය/රැකියාව තනතුර :

07. උපත පිළිබඳ විස්තර :

7.1 උපන් දිනය

7.2 උප්පැන්න සහතිකයේ අංකය

7.3 උපන් ස්ථානය

7.4 කොට්ඨාසය

7.5 දිස්ත්‍රික්කය

අයදුම්කරු ශ්‍රී ලංකාවෙන් පිටත උපන් තැනැත්තකු නම් 1948 අංක 18 දරන පුරවැසි පනතේ 5(2) වන වගන්තිය යටතේ නිකුත් කරන ලද පුරවැසි සහතිකයේ තොරතුරු :

7.6 උපන් රට

7.7 නගරය

7.8 සහතිකයේ අංකය

08. පදිංචිය පිළිබඳ විස්තර

8.1 ස්ථිර ලිපිනය

නිවසේ නම හෝ අංකය

සහාධිපත්‍යයේ, නිවාසයේ, නිවාස යෝජනා ක්‍රමයේ, නවාතැනේ හෝ වෙනත් පදිංචි ස්ථානයේ නම

පාර/වීදිය/පටුමග/පෙදෙස/උද්‍යානය

ගම/නගරය

තැපැල් කේතය

8.2 තැපැල් ලිපිනය

නිවසේ නම හෝ අංකය

සභාධිපත්‍යයේ, නිවාසයේ, නිවාස යෝජනා ක්‍රමයේ, නවාතැනේ හෝ වෙනත් පදිංචි ස්ථානයේ නම

පාර/වීදිය/පටුමග/පෙදෙස/උද්‍යානය

ගම/නගරය

තැපැල් කේතය

09. පුරවැසි සහතිකය/ද්විත්ව පුරවැසි සහතිකය පිළිබඳ විස්තර. (අදාළ නොවන කොටස කපා හරින්න)

9.1 සහතිකයේ අංකය

9.2 සහතිකය නිකුත් කළ දිනය

හැඳුනුම්පතෙහි දෙවන පිටපතක් ඉල්ලුම් කරන්නේ නම් කරුණාකර 10 වන කොටස සම්පූර්ණ කරන්න.

10. (අදාළ කොටුව ඉදිරියෙන් √ ලකුණ යොදන්න.)

10.1 හැඳුනුම්පත නැතිවූයේ නම් ඒ සඳහා ☐ 10.2 හැඳුනුම්පත සංශෝධනය කිරීම සඳහා ☐

10.3 වලංගු කාලය අලුත් කිරීම සඳහා ☐ 10.4 හැඳුනුම්පත හානි වීම/පලුදුවීම/අපැහැදිලි වීම සඳහා ☐

10.5 නැති වූ හෝ අවසන් වරට ලබා ගත් හැඳුනුම්පතේ අංකය

10.6 හැඳුනුම්පත නිකුත් කළ දිනය

10.7 නැති වූ හැඳුනුම්පතක් සඳහා පොලිස් වාර්තාව හෝ අදාළ වෙනත් ලියකියවිලි පිළිබඳ විස්තර

පොලිස් ස්ථානයේ නම

පොලිස් සහතිකය නිකුත් කළ දිනය

11. විමසීම් සඳහා අවශ්‍ය තොරතුරු :-

| | නිවස | ජංගම |
|---|---|---|
| 11.1 දුරකථන අංකය | | |
| 11.2 විද්‍යුත් තැපෑල | | |

පරිලෝකනය කිරීමේ ඡායාරූපය මෙහි අලවන්න

ඡායාරූපය මෙහි අලවන්න

සහතික කිරීමේ නිලධරයාගේ අත්සන සහ නිල මුද්‍රාව

ඉල්ලුම්කරුගේ ප්‍රකාශය ඃ

(1) මම ශ්‍රී ලංකාවේ පුරවැසියකු බව ප්‍රකාශ කරමි.

(2) මම මෙම ඉල්ලුම්පත සම්පූර්ණ කිරීමට පෙර මේ සමග ඇති උපදෙස් පත්‍රිකාව කියවා තේරුම් ගත් බව ප්‍රකාශ කරමි.

(3) මම මගේ ඡායාරූප දෙකක් මෙහි ඇතුළත් කරමි.

(4) මම මේ සමග අංක .................. දරන හැඳුනුම්පත/නැති වූ අංක ........................ දරන හැඳුනුම්පත වෙනුවෙන් ලබා ගත පොලිස් වාර්තාව සහතික කිරීමේ නිලධරයා වෙත භාර දෙමි.
(අදාළ නොවන කොටස කපා හරින්න.)

(5) මීන් පෙර මා විසින් වෙනත් ඉල්ලුම්පත්‍රයක් ඉදිරිපත් කරන ලද/නොකරන ලද බව මම ප්‍රකාශ කරමි. (අදාළ නොවන කොටස කපා හරින්න)

(6) මෙහි ඉහත දක්වෙන විස්තර මා හොඳින් දන්නා පරිදි හා විශ්වාස කරන අන්දමට සත්‍ය හා නිවැරදි බව මම මෙයින් ප්‍රකාශ කරමි.

(7) මේ ඉල්ලුම්පත්‍රය සමග ඉදිරිපත් කරනු ලබන සියලුම ලියකියවිලි මා හොඳින් දන්නා පරිදි හා විශ්වාස කරන අන්දමට සත්‍ය හා නිවැරදි බවත්, සත්‍ය තොරතුරු වසන් කිරීම සඳහා එකී ලියකියවිලි ව්‍යාජ ලෙස වෙනස් කිරීම් වලට හෝ එකතු කිරීම්වලට භාජන නොකරන ලද බවත් පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ පනත යටතේ ලියාපදිංචි වී හඳුනාගැනීමේ පත්‍රයක්/හඳුනාගැනීමේ පත්‍රයේ දෙවන පිටපතක් ඉල්ලුම්කිරීමට හිමිකම් ඇති බවත් (අදාළ නොවන කොටස කපා හරින්න) මම මෙයින් සහතික කර ප්‍රකාශ කර සිටිමි. තව ද අසත්‍ය දත්ත, තොරතුරු හෝ ලියවිලි ඉදිරිපත් කිරීම දඬුවම් ලැබිය හැකි වරදක් බව මම දනිමි.

| දිනය | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|

ඉල්ලුම්කරුගේ අත්සන හෝ වම් මහපටැඟිලි සලකුණ ☐

දෙවන කොටස - සහතික කිරීමේ නිලධරයා විසින් සම්පූර්ණ කළ යුතුය.

සහතික කිරීමේ නිලධරයාගේ සහතිකය ඃ

මෙම ඉල්ලුම්පතේ අලවා ඇති ඡායාරූප හා සපයා ඇති තොරතුරු අංක ................................ දරන ඉල්ලුම්පත ඉදිරිපත් කරනු ලබන එම ඉල්ලුම්පත්‍රයේ අංක 8 හි සඳහන් ලිපිනයේ පදිංචි .................................................................................................................... ගේ බව ද, අලවා ඇති ඡායාරූපය වෙස් මාරු කිරීම්වලින් හෝ සැඟවීම් වලින් තොරව ඉල්ලුම්කරුගේ ස්වාභාවික තත්වය පිළිඹිබු කරන බව ද මම සහතික කරමි. ඉහත ඡායාරූපය මත මාගේ අත්සන හා නිල මුද්‍රාව තබන ලද බවත් ඉල්ලුම්කරුගේ අත්සන/වම් මහපටැඟිලි සලකුණ මා ඉදිරිපිට දී තබන ලද බවත් සහතික කරමි.

සහතික කිරීමේ නිලධරයාගේ නම ☐

| දිනය | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|

සහතික කිරීමේ නිලධරයාගේ අත්සන හා නිල මුද්‍රාව ☐

අනු අත්සන් කරමි.

ප්‍රාදේශීය ලේකම්වරයාගේ අත්සන හා නිල මුද්‍රාව ☐

ගාස්තු ගෙවීම් පිළිබඳ විස්තර

| සහතිකයේ හෝ කුවිතාන්සියේ අංකය | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|

මුද්දර/සහතිකය/කුවිතාන්සිය මෙහි අලවන්න.

| |
|---|
| |

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා

| සටහන් |
|---|
| |

තුන් වන කොටස - හඳුනාගැනීමේ පත්‍රයක් සඳහා ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කළ බවට නිකුත් කරන කුවිතාන්සිය

QR Code

හැඳුනුම්පතක් ලබා ගැනීම සඳහා ................ වැනි දින ..................................... ස්වාමීන් වහන්සේ/පූජකතුමා/පූජකතුමිය/මහතා/මිය/මෙය විසින් මා වෙත භාර දෙන ලද අංක .......................... දරන අයදුම්පත්‍රය පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් ජනරාල් වෙත යැවීමට භාරගත් බව මෙයින් දන්වා සිටිමි.

සහතික කිරීමේ නිලධරයාගේ නම

දිනය | | | | | | | | |

සහතික කිරීමේ නිලධරයාගේ අත්සන හා නිල මුද්‍රාව

------------------------------------------------------------ මෙතැනින් වෙන් කරන්න ------------------------------------------------------------

''ආ'' ඉල්ලුම්පත සම්පූර්ණ කිරීම සඳහා උපදෙස් :-

1. ඉල්ලුම්පත පිරවීම සඳහා නිල් හෝ කළු බෝල්පොයින්ට් පෑනක් පමණක් භාවිත කරන්න. එක් කොටුවක එක් අකුරක් පමණක් ලියන්න. ඡායාරූප මි. මි. 35 පළල x මි. මි. 45 උස ප්‍රමාණයේ වර්ණ ඡායාරූප විය යුතු ය. පරිලෝකනයට අදාළ ඡායාරූප මත කිසිවක් නොලිවිය යුතු අතර එය විකෘති නොකළ යුතු ය.

2. පැහැදිලි හා කියවිය හැකි අත් අකුරෙන් ලියන්න.

3. 1 වන කොටුව සිංහල හෝ දෙමළ අකුරෙන් පිරවිය යුතු අතර, 2 වන කොටුව ඉංග්‍රීසි අකුරෙන් පිරවිය යුතු ය.

4. සෑම සම්පූර්ණ වචනයකට ම පසුව එක් කොටුවක් හිස්ව තබන්න.

5. නියමිත ගාස්තුව පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් ජනරාල්වරයාට, ග්‍රාම නිලධාරිවරයාට, ප්‍රාදේශීය ලේකම්වරයාට හෝ කොමසාරිස් ජනරාල්වරයා විසින් නම් කරන ලද යම් තැනැත්තකුට ගෙවනු ලැබූ බවට වන කුවිතාන්සිය අලවා තිබිය යුතු ය. කුවිතාන්සි අංකය ද සටහන් කළ යුතු ය. මුද්දර වලින් ගෙවන්නේ නම් එම මුද්දර ඇලවිය යුතු ය.

6. ග්‍රාම නිලාධාරිවරයා විසින් ඉල්ලුම්පත සහතික කරන්නේ නම් පදිංචිය සනාථ කිරීම සඳහා වෙනත් ලියකියවිලි අවශ්‍ය නැත. වෙනත් නිලධරයෙක් සහතික කරන්නේ නම් පදිංචිය සනාථ කිරීම සඳහා ලියකියවිලි අවශ්‍ය වේ.

7. ඉල්ලුම්කරුගේ අත්සන හෝ වම් මහපටැඟිලි සලකුණ සහතික කිරීමේ නිලධරයා ඉදිරිපිට තැබිය යුතු ය.

8. ග්‍රාම නිලධාරිවරයා විසින් සහතික කරන ලද ඉල්ලුම්පත ප්‍රාදේශීය ලේකම්වරයා හෝ සහකාර ප්‍රාදේශීය ලේකම්වරයා හෝ පරිපාලන නිලධාරී හෝ පරිපාලන ග්‍රාම නිලධාරි හෝ විසින් පමණක් අනු අත්සන කළ යුතු ය.

9. අයදුම්පතේ තීරයන් සම්පූර්ණ කිරීමේ දී පහත දක්වා ඇති උපදෙස් පිළිපැදිය යුතු යː-

(i) උප්පැන්න සහතිකයේ/අනුමාන වයස් සහතිකයේ/පුරවැසි සහතිකයේ /ද්විත්ව පුරවැසි සහතිකයේ/පූජ්‍යත්වය සනාථ කරන සහතිකයේ/දරුකමට හදා ගැනීමේ සහතිකයේ සඳහන් පරිදි සම්පූර්ණ නම ලියන්න. පහත දැක්වෙන ආදර්ශය අනුව අයදුම්පත්‍රය පිරවිය යුතු ය. පෙළපත් නාමය හෝ වාසගම නොමැති නම් අදාළ කොටු හිස්ව තබන්න.

''පුරවැසි සහතිකය'' යන්නට 1949 අංක 03 දරන ඉන්දියානු සහ පකිස්ථානු වාසීන්ගේ (පුරවැසි) පනත හෝ'' 1967 අංක 14 දරන ඉන්දු - ලංකා ගිවිසුම (ක්‍රියාත්මක කිරීමේ) පනත යටතේ නිකුත් කරන ලද ලියාපදිංචි සහතිකයක් හෝ 1948 අංක 18 දරන පුරවැසි පනත, 1988 අංක 39 දරන අදේශිකයන්ට පුරවැසිභාවය ප්‍රදානය කිරීමේ (විශේෂ විධිවිධාන) පනත, 2003 අංක 35 දරන ඉන්දියානු සම්භවයක් සහිත තැනැත්තන්ට පුරවැසිභාවය ප්‍රදානය කිරීමේ පනත හෝ 2008 අංක 38 දරන චීන සම්භවයක් සහිත තැනැත්තන්ට, පුරවැසිභාවය ප්‍රදානය කිරීමේ පනත යටතේ නිකුත් කරන ලද පුරවැසි සහතිකයක් ඇතුළත් වේ.

| | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| පෙළපත් නාමය | නැ | වු | න් | ග | ල | | | | | | | | | | |
| | ජා | ගො | ඩ | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | |
| නම | ච | මි | න් | ද | | | | | | | | | | | |
| | ජ | ය | ලා | ල් | | | | | | | | | | | |
| වාසගම | සේ | නා | ර | ත් | න | | | | | | | | | | |

(ii) ඉහත 1 වන කොටුවේ සිංහල හෝ දෙමළ අකුරින් සඳහන් කළ නම ඉංග්‍රීසි කැපිටල් අකුරින් 02 වන කොටුව තුළ යටතේ සටහන් කළ යුතු ය.

(iii) ඉහත 1 වන කොටුවේ සඳහන් කළ නමට වඩා වෙනස් නමක් හැඳුනුම්පතට ඇතුළත් කර ගැනීමට අවශ්‍ය වන්නේ නම් ඒ පිළිබඳව සළකා බැලීම සඳහා එම නම 3 වන කොටුවෙහි සඳහන් කළ යුතු ය. එම නම උප්පැන්න සහතිකයේ සඳහන් නමට වඩා වෙනස් නම් ඒ බව සනාථ කිරීම සඳහා ලියවිලි ඉදිරිපත් කළ යුතු ය.

(iv) 6 වන කොටුවේ කාර්ය සඳහා රැකියාව/වෘත්තීය/තනතුර සනාථ කිරීම සඳහා සහතිකයක්/ලේඛනගත සාක්ෂි අමුණා තිබිය යුතු ය. (මාස 6ක් ඇතුළත ලබා ගත් සහතිකයක් විය යුතු ය.)

(v) 7-1 සිට 7-5 දක්වා කොටු උප්පැන්න සහතිකයේ සඳහන් තොරතුරු වලට අනුව සම්පූර්ණ කරන්න. 7-6 සිට 7-9 දක්වා කොටු සම්පූර්ණ කළ යුත්තේ ශ්‍රී ලංකාවෙන් පිටත උපන් තැනැත්තන් පමණි. දෙමාපියන්ගෙන් එක් අයෙකු හෝ ශ්‍රී ලාංකික වූ දෙමාපියන්ගේ දරුවකු ශ්‍රී ලංකාවෙන් පිටත උපන් අවස්ථාවක දී 1948 අංක 18 දරන පුරවැසි පනතේ 5(2) වගන්තිය යටතේ නිකුත් කරන ලද පුරවැසි සහතිකයේ තොරතුරු ඇතුළත් කළ යුතු ය.

(vi) ස්ථිර පදිංචි ලිපිනය 8-1 කොටුවේ සඳහන් කළ යුතු ය. 8-2 කොටුව සම්පූර්ණ කළ යුත්තේ අයදුම්කරු 8-1 හි සඳහන් ලිපිනය හැර වෙනත් ලිපිනයක පදිංචිව සිටින්නේ නම් පමණි.

(vii) 9 වෙනි කොටුව සම්පූර්ණ කළ යුත්තේ ද්විත්ව පුරවැසිභාවය ලබා ඇති හෝ ලියාපදිංචියෙන් ශ්‍රී ලංකාවේ පුරවැසිභාවය ලබා ඇති තැනැත්තන් පමණි. අදාළ සහතිකයේ විස්තර මෙහි සඳහන් කරන්න.

(viii) 10 වන කොටුව සම්පූර්ණ කළ යුත්තේ හැඳුනුම්පතේ අනු පිටපතක් සඳහා ඉල්ලම් කරන්නේ නම් පමණි. නැති වූ හැඳුනුම්පත පිළිබඳ පොලිස් පැමිණිල්ලේ පිටපත අයදුම්පත සමග අමුණා එවිය යුතු ය.

(ix) ඉල්ලුම්පත පිළිබඳ තත්වය සම්බන්ධව දැනුම් දීම සඳහා ඔබව සම්බන්ධ කර ගත හැකි තොරතුරු 11 වන කොටුවෙහි ඇතුළත් කරන්න.

10. සහතික කිරීමේ නිළධරයා විසින් සත්‍ය බවට සහතික කරන ලද අවශ්‍ය ලේඛනවල ඡායා පිටපත් අයදුම් පත්‍රය සමග අමුණා එවිය යුතු ය. (මේ සම්බන්ධ වැඩි දුර උපදෙස් සඳහා ග්‍රාම නිලධාරීවරයා අමතන්න) :-

(i) සහතික කිරීමේ නිලධරයා විසින් සත්‍ය බවට සහතික කරන ලද උප්පැන්න සහතිකයේ/අනුමාන වයස් සහතිකයේ ඡායා පිටපතක්

(ii) දිවුරුම් ප්‍රකාශයක් සමග 1951 උපත් සහ මරණ ලියාපදිංචි ආඥාපනතේ 51 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද ලේඛන සෙවීමේ ප්‍රතිඵල සටහන සහ උපන් දිනය හා නම සනාථ කිරීම සඳහා වෙනත් ලේඛන.

(iii) සහතික කිරීමේ නිලධරයා විසින් සත්‍ය බවට සහතික කරන ලද විවාහ සහතිකයේ ඡායා පිටපතක් (විවාහක කාන්තාවක්, විවාහයෙන් පසු ස්වාමිපුරුෂයාගේ නම, හඳුනාගැනීමේ පත්‍රයෙහි ඇතුළත් කිරීමට අදහස් කරන්නේ නම්).

(iv) සහතික කිරීමේ නිලධරයා විසින් සත්‍ය බවට සහතික කරන ලද පුරවැසි සහතිකයේ/ද්විත්ව පුරවැසි සහතිකයේ ඡායා පිටපතක්.

(v) සහතික කිරීමේ නිලධරයා විසින් සත්‍ය බවට සහතික කරන ලද සාමනේර/උපසම්පදා සහතිකයේ හා ඡායාපිටපත්/(පැවිදි නමින් හැඳුනුම්පත ඉල්ලීමේ දී).

(vi) සහතික කිරීමේ නිලධරයා විසින් සත්‍ය බවට සහතික කරන ලද උපැවිදි සහතිකයේ ඡායාපිටපත් (උපැවිදි වූ පසු ගිහි නමින් හැඳුනුම්පත ඉල්ලීමේදී)

(vii) සහතික කිරීමේ නිලධරයා විසින් සත්‍ය බවට සහතික කරන ලද, අදාළ අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු මගින් යම් ආගමක පූජ්‍යත්වය තහවුරු කිරීම සඳහා නිකුත් කරන ලද සහතිකයක හෝ ලියවිල්ලක ඡායා පිටපත්.

(viii) නියමිත කාලය තුළ ඉල්ලුම් කිරීමට නොහැකිවීම පිළිබඳ අයදුම්කරුවන් විසින් සඳහන් කරන ලද හේතු අඩංගු ප්‍රාදේශීය ලේකම් වාර්තාව.

"ඈ" ආකෘති පත්‍රය
படிவம் "ஈ"
Form "D"

ශ්‍රී ලංකා
இலங்கை
SRI LANKA

හැඳුනුම්පත
அடையாள அட்டை
IDENTITY CARD

ඉල්ලුම්කරුගේ ජායාරූපය
விண்ணப்பகாரரின் புகைப்படம் :
Photograph of the applicant

නම් :
பெயர் :
Name :

ස්ත්‍රී/ පුරුෂ භාවය :
பால் :
Sex :

උපන් දිනය :
பிறந்த திகதி :
Date of Birth :

දරන්නාගේ අත්සන
வைத்திருப்பாளரின் கையொப்பம்
Holder's Signature.

ජාතික හැඳුනුම්පත් අංකය :
அடையாள அட்டை இல. :
Identity Card No :

ලිපිනය :
முகவரி :
Address :

උපන් ස්ථානය :
பிறப்பிடம் :
Place of Birth :

නිකුත් කළ දිනය :
வழங்கப்பட்ட திகதி :
Date of issue :

පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් ජනරාල්වරයාගේ අත්සන
ஆட்களைப் பதிவு செய்தல் ஆணையாளர் தலைமையதிபதியின் கையொப்பம் :
The Signature of the Commissioner General for Registration of Persons

පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් ජනරාල්
ஆட்களைப் பதிவு செய்தல் ஆணையாளர் தலைமையதிபதி
தலைமையதிபதியின் கையொப்பம் :
Commissioner General for Registration of Persons

1968 අංක 32 දරන පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ පනත
*1968 ஆம் ஆண்டின் 32 ஆம் இலக்க, ஆட்களைப் பதிவு செய்தல் சட்டம்*
Registration of Persons Act, No. 32 of 1968

(17 වන නියෝගය)

1968 අංක 32 දරන පුද්ගලයන් ලියාපදිංච කිරීමේ පනත

''උ'' ආකෘතිය

| සහතික අංකය | |
|---|---|

ඡායාරූප ශිල්පියකු වශයෙන් ලියාපදිංචි කිරීමේ සහතිකය

1. ඡායාරූපාගාරයේ නම :- ..................................................
2. ඡායාරූපාගාරයේ ලිපිනය :- ..................................................
3. ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ අංකය සහ ලියාපදිංචි කිරීමේ දිනය :- ..................................................
4. හිමිකරුගේ නම :- ..................................................
5. හිමිකරු පදිංචි ලිපිනය :- ..................................................
6. ලියාපදිංචි අංකය :- ..................................................
7. ලියාපදිංචි කිරීමේ දිනය :- ..................................................
8. ලියාපදිංචි කිරීම කල් ඉකුත් වන දිනය :- ..................................................

ඉහත විස්තර කරනු ලබන තැනැත්තා මෙම සහතිකයේ පසුපිටේ නිශ්චිතව සඳහන් කරනු ලබන කොන්දේසිවලට යටත්ව, 1968 අංක 32 දරන පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ පනත යටතේ ඡායාරූප ගැනීමට පහසුකම් සහිත ඡායාරූපාගාරයක් හිම ඡායාරූප ශිල්පියකු වශයෙන් ලියාපදිංචි කරන ලද බව මෙයින් සහතික කරමි.

......................................
දිනය

......................................................
කොමසාරිස් ජනරාල්
පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව

කොන්දේසි

ලියාපදිංචි ඡායාරූප ශිල්පියකු පහත සඳහන් කොන්දේසිවලට අනුකූලව ක්‍රියා කළ යුතු ය.

1. යම් ඉල්ලුම්කරුවකුගේ ඡායාරූප 12 වන නියෝගයට අනුකූලව ලබාගත යුතු ය.
2. ඡායාරූපවල පිටපත් දෙකක් එක් එක් ඉල්ලුම්කරු වෙත ලබා දිය යුතු අතර ඡායාරූපයේ ඩිජිටල් පිටපත දෙන ලද උපදෙස්වලට අනුව පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව වෙත යැවිය යුතු ය.
3. ලියාපදිංචි ඡායාරූප ශිල්පියකු විසින් ඡායාරූපයේ පිටපත් දෙකක් සඳහා අයකරනු ලබන උපරිම ගාස්තුව අමාත්‍යවරයා විසින් 1968 අංක 32 දරන පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ පනතේ 36(2) වන වගන්තියට අනුව ගැසට් නිවේදනයක් මගින් නියම කරන පරිදි විය යුතු ය.
4. සෑම ඉල්ලුම්කරුවකු වෙත රිසිට්පතක් නිකුත් කළ යුතු අතර, නරක් වූ ඡායාරූප සම්බන්ධයෙන්, 12 වන නියෝගයට අනුකූලව අලුත් ඡායාරූපයක් ගාස්තු රහිතව නිකුත් කළ යුතු ය.
5. පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් ලබා දෙනු ලබන මෘදුකාංග වෙනත් යම් පාර්ශවයක් වෙත ලබා නොදිය යුතු ය.
6. පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් ලබා දෙනු ලබන මෘදුකාංග වෙනස් නොකළ යුතු ය.
7. පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් ලබා දෙනු ලබන උපදෙස්වලට අනුව මෘදුකාංග භාවිතා කළ යුතු ය.
8. ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් නියම කරනු ලැබිය හැකි ජංගම සේවාවන් වල දී හා අවශ්‍ය වන්නා වූ අවස්ථාවන් හි දී ලියාපදිංචි ඡායාරූප ශිල්පියකු විසින් ඉල්ලුම්කරුවන්ගේ ඡායාරූප ගනු ලැබිය යුතු ය.

01 - 417

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.